මෙම වාර්තාවේ 2.2.5 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය මගින් මිලදීගෙන තිබූ වී තොග බොහෝ විට අඩු මිලට විකිණීමෙන් ඊළඟ කන්නයේ වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය මුදල් සොයා ගැනීම හා අලෙවියෙන් වූ පාඩු පියවාගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් සහ බැංකු වෙතින් ණය ලබාගැනීමේ ක්‍රමවේදය අඛණ්ඩව ක්‍රියාත්මක කර තිබුණි. මෙම තත්ත්වය හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව නිරීක්ෂණය කෙරේ.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 05 අනුව, වී, සෝයා බෝංචි සහ සහල් තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයන්ගෙන් අඩු අගයට ගිණුම්ගත කළ යුතු වුවද, වර්ෂය අවසානයට ප්‍රදේශීය කළමනාකරුවන්ගෙන් ලබාගත් වාර්තා මත රුː 4,555,081,250 කට තොගය අගය කර ගිණුම්ගත කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 ප්‍රකාර පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 18 පරිදි ඉඩම් හා ගොඩනැගිලි වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වුවද, පිරිවැය රුː 13,710,714 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි එක් ශේෂයක් ලෙස ගෙන ගිණුම්ගත කර තිබුණි. එම පිරිවැය මත වර්ෂයකට සියයට 2.5 බැගින් ක්ෂය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයට පෙර තිබූ වත්කම් හා බැරකම් ශේෂවල එකතුව පිළිවෙළින් රු: 277,911,624 ක් හා රු: 166,994,520 ක් හඳුනාගැනීමකින් තොරව අවිනිශ්චිත ගිණුමක රඳවා තිබුණු අතර, 2009 වර්ෂයෙන් පසු සිදු වූ ගනුදෙනුවලින් පැන නැගුනු රු: 1,135,701 ක් වටිනා වත්කම් හා රු: 26,239,640 ක් වටිනා බැරකම් ද එම අවිනිශ්චිත ගිණුමේ රඳවා තිබුණි.

(ආ) ණය පොලී ගෙවීම සඳහා සහ වී කෙටුම් කුලී හා ප්‍රවාහන ගාස්තු සඳහා භාණ්ඩාගාරයෙන් ලද පිළිවෙළින් රු: 346,190,000 ක් හා රු: 110,000,000 කින් පිළිවෙළින් රු: 307,263,861 ක් හා රු: 91,321,775 ක් පියවා ඉතිරියේ එකතුව වූ රු: 57,604,384 ක මුදල සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ආදායම් ප්‍රකාශනයේ සහල් විකුණුම් පිරිවැය සදොස් ලෙස ගණනය කිරීම හේතුවෙන් විකුණුම් පිරිවැය රු: 601,547,073 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් වසරේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ජීවන වියදම් හා ආහාර සුරක්ෂිත කමිටුවේ තීරණය පරිදි රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත, මණ්ඩලයට අයත් රු: 1,281,892,217 ක් වටිනා සහල් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩා වල තැන්පත් කිරීම සඳහා බාර දී තිබුණි. එම මුළු සහල් තොගයම සාවද්‍ය ලෙස සමාලෝචිත වර්ෂයේ විකුණුම් ලෙස ගිණුම් ගත කර තිබුණි. කෙසේ වෙතත්, මෙම මුළු තොගයෙන් රු: 611,986,069 ක් වටිනා සහල් තොගයක් 2011 දෙසැම්බර් 31 දින වන විටත් නොවිකිණී ගබඩා වල ඉතිරිව තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වියදම් සඳහා භාණ්ඩාගාරයෙන් ලද රු: 182,900,000 ක් වූ මුදල ආදායම් ප්‍රකාශනයේ අනිකුත් ආදායම් ලෙස ගිණුම්ගත කිරීමෙන් වර්ෂයේ ලාභය ඊට සමාන වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අවසානයට අයවිය යුතු ගබඩා බදු කුලී රු: 3,697,500 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ සිදුකළ ඉදිකිරීම් 08 ක් වෙනුවෙන් ගෙවා තිබුණු රු: 71,076,719 ක මුදල කෙරී ගෙන යන වැඩ ලෙස හෝ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම් ගත නොකොට මූල්‍ය ප්‍රකාශනවල අත්තිකාරම් ලෙස පෙන්වා තිබුණි.

(ඌ) දීර්ඝ කාලයක සිට ඉදිරියට ගෙන එමින් පැවති ණයගැති ශේෂ මත ප්‍රමාණවත් බොල් හා අඩමාන ණය සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.4 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2009 වර්ෂයේ සිට පැවත එන රු: 10,591,838 ක් ද ඇතුළුව, රාජ්‍ය ආයතන 8 කින් ලැබිය යුතු රු: 1,086,844,771 කින් 2013 සැප්තැම්බර් 24 දින වන විටත් මණ්ඩලය අයකර ගෙන තිබුණේ රු: 579,247,996 ක් පමණි. ඒ අනුව, රු: 507,596,775 ක මුදලක් අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ සිට ආයතන 06 කින් ලැබිය යුතු රු: 20,795,578 ක් ද ඇතුළුව, ලැබිය යුතු රු: 150,676,283 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට මණ්ඩලය 2013 සැප්තැම්බර් 30 දින තෙක් ක්‍රියාකර නොතිබුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් ගිණුම් විෂයයන් ඉදිරියෙන් සඳහන් කර ඇති සාක්ෂි නොමැතිවීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ සත්‍යාපනය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම රු: | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| ස්ථාවර වත්කම් | 13,710,714 | ස්ථාවර වත්කම් ලේඛන, හිමිකම් ඔප්පු |
| වී, සෝයා බෝංචි, සහල් සහ මාර්ගස්ථ තොග | 4,555,191,889 | තොග ලේඛන, තොග සමීක්ෂණ වාර්තා, මාර්ගස්ථ තොග සනාථ කිරීමේ ලියවිලි |
| සහල්, වී සහ සෝයා බෝංචි විකුණුම් ණය ගැතියෝ | 1,086,844,771 | ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් |
| බැංකු ණය හා භාණ්ඩාගාර අත්තිකාරම් | 5,487,454,030 | කාල විශ්ලේෂණ, ශේෂ සනාථ කිරීම් |
| බැංකු අයිරාව | 247,131,449 | අනුමැතිය ලබාගැනීමට අදාළ විස්තර, ශේෂ සනාථ කිරීමේ ලියවිලි, කාල විශ්ලේෂණ |
| ආයෝජන | 283,044,402 | ආයෝජන සහතික හා කාල විශ්ලේෂණ |
| ආයෝජන පොලී ආදායම් | 14,549,943 | පොලී ආදායම් ගණනය කළ ආකාරය |

### 2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නිරීක්ෂණය වූ අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (5) (ඩී) වගන්තිය | විගණකාධිපතිවරයාගේ එකඟත්වය ඇතිව අවම අභ්‍යන්තර විගණන වැඩ සටහනක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතු වුවද, මණ්ඩලය විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මු.රෙ. 135-139 | මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පැවරීම හා මූල්‍ය බලතල බෙදීමක් මණ්ඩලය විසින් සිදු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) මු. රෙ. 188 (2) | සමාලෝචිත වර්ෂය තුළ බැංකුවේ තැන්පත් කළ රුෑ 12,140,745 ක් වටිනා චෙක්පත් 07 ක් 2012 අගෝස්තු මාසය වන විටත් උපලබ්ධි වී නොතිබීම සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ග ගෙන ඇති බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණද, එම චෙක්පත් 2013 සැප්තැම්බර් 30 දක්වාම නිරවුල් වී නොතිබුණි. |
| (ඈ) 2007 ජූලි 25 දිනැති අංක 07/1199/315/31 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය ඈවර කර අධිකාරිය සතු සියලුම වත්කම් හා බැරකම් 2007 ජූලි 25 දින නැවත ආරම්භ කළ මණ්ඩලය වෙත පවරා ගත යුතු වුවත්, රු.184,658,970 ක් වූ ස්ථාවර තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, අතැති මුදල් ශේෂ, සේවක අත්තිකාරකම් යනාදී වත්කම් පමණක් පවරාගෙන තිබූ අතර, අනෙකුත් වත්කම් හා වගකීම් පවරා ගැනීමට හා අධිකාරියේ ඈවර කිරීමේ කටයුතු ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.5.1 ඡේදය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 | එකතුව රු.13,710,714 ක් වූ ස්ථාවර වත්කම් වර්ෂ 6 කට වැඩි කාලයක සිට සමීක්ෂණය කර නොතිබුණි. |
| (ඊ) 2010 දෙසැම්බර් 16 දිනැති අංක අමප/10/2762/447/013 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | භාණ්ඩාගාරයෙන් ලබා දී තිබූ රු. මිලියන 2,000 ක් වූ අත්තිකාරම් මුදල් සහල් අලෙවියෙන් ලද මුදලින් පියවීමට කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ සහල් අලෙවියෙන් ලද රු. 708,232,048 ක මුදලින් මෙම අත්තිකාරම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදය | බඳවා ගත් නිලධාරීන් 04 දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු අසම්පූර්ණ හෙයින් ඒ තුළ වෛද්‍ය වාර්තා, වැටුප් වර්ධක අනුමත කිරීම්, රාජකාරී වැඩ හා හැසිරීම් සතුටුදායක ලෙස ඉටුකළ වාර්තා යනාදිය ඇතුළත් වී නොතිබුණි. |
| (ඌ) 1988 අංක 74 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනත | ඉහත සඳහන් නිලධාරීන් 04 දෙනා විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ලාභය රු. 264,125,792 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු. 346,747,035 වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 610,872,827 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කෙසේ නමුදු මෙම වාර්තාවේ 2.2.3 හි (ආ) සිට (ඊ) ඡේදවලින් දැක්වෙන ලාභය වැඩියෙන් දැක්වීම වූ රු. මිලියන 247 ක මුදල ගලපන ලද්දේ නම් සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 264 ක් වූ ලාභය රු. මිලියන 17 ක් දක්වා අඩුවනු ඇත.

### 3.2 වියදම් වල අසාමාන්‍ය වැඩිවීම

2011 වර්ෂය තුළ මණ්ඩලය ණය මුදල් මත දැරූ මුළු මූල්‍ය පිරිවැය රු. 329,644,154 ක් වූ අතර, එය මුළු ආදායම වූ රු. 631,978,105 හි ප්‍රතිශතයක් ලෙස ගත් විට සියයට 52ක් විය. කෙසේ නමුත්, 2011 වර්ෂයේ ආදායම තුළ රු. 554,090,000 ක භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදානයන් විය. ඒ අනුව, එය ඉවත් කර ශුද්ධ මෙහෙයුම් ආදායම් වූ රු. 77,888,105 සමඟ සසඳන ලද්දේ නම් එය මුළු ආදායමෙන් සියයට 423 ක් විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 11,955 ක් වැය කර වී මෙට්‍රික් ටොන් 400,000 ක් මිලදී ගැනීම සඳහා ඉලක්ක කර තිබුණද, රු. මිලියන 2,278 ක් වැය කර වී මෙට්‍රික් ටොන් 80,144 ක් පමණක් මිලදී ගෙන තිබුණි. එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 20 ක් වී තිබුණි. වී මිලදී ගැනීම ඉකුත් වර්ෂය සමඟ සසඳන කල සියයට 47 ක පිරිහීමක් විය.

(ආ) 2011 වර්ෂයේ යල හා මහ කන්නවල වී මිලදී ගැනීම්වලින් පිළිවෙළින් සියයට 78 ක් හා සියයට 84 ක ප්‍රතිශතයකින් මණ්ඩලය විසින් නාඩු වී මිලදී ගෙන තිබුණත් දේශීය වශයෙන් වැඩිපුර පරිභෝජනය කරනු ලබන සම්බා සහල් මිලදී ගැනීමට මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය අඩු වී තිබුණි. මණ්ඩලය මිලදී ගත් වී වර්ග ප්‍රතිශතයන් අනුව පහත දැක්වේ.

| කන්නය | සම්බා | නාඩු | මුළු මිලදී ගැනීම් | මුළු වී මිලදී ගැනීම්වලින් එක් එක් වී වර්ග මිලදී ගැනීමේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|
| | මෙ.ටෙ. | මෙ.ටො. | මෙ.ටො. | සම්බා % | නාඩු % |
| යල | 16,516.9 | 60,103.9 | 76,620.8 | 22 | 78 |
| මහ | 556.6 | 2,967.4 | 3,524.0 | 16 | 84 |

(ඇ) වී මිලදී ගැනීමේ වැඩසටහන අනුව, සමස්ත වී නිෂ්පාදනයෙන් අවම වශයෙන් සියයට 5- 10 අතර ප්‍රතිශතයකින් මණ්ඩලය විසින් සෘජුව ගොවීන්ගෙන් වී මිලදී ගැනීම රජයේ ඉලක්කගත සැලැස්ම වුවත්, එම ඉලක්කයට ළඟා වීමට මණ්ඩලය

අපොහොසත් වී තිබුණි. ලබා දෙන ලද තොරතුරු අනුව, 2010 යල කන්නය හැරුණු විට මුළු වී නිෂ්පාදනයෙන් වී මිලදී ගැනීමේ ප්‍රතිශතය සියයට 5 වඩා අඩු මට්ටමක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| | 2009/2010 මහ | 2010 යල | 2010/2011 මහ | 2011 යල | එකතුව |
|---|---|---|---|---|---|
| | මෙ.ටොන් | මෙ.ටොන් | මෙ.ටොන් | මෙ.ටොන් | මෙ.ටොන් |
| මුළු නිෂ්පාදනය | 2,630,000 | 1,671,000 | 1,996,000 | 1,879,000 | 8,176,000 |
| මණ්ඩලය වී මිලදී ගැනීම | 73,192 | 115,714 | 3,524 | 76,621 | 269,051 |
| මුළු නිෂ්පාදනයෙන් මණ්ඩලය වී මිලදී ගැනීමේ ප්‍රතිශතය | 2.8 | 6.9 | 0.2 | 4.1 | 3.3 |

ඇ) මණ්ඩලයේ සම්මත පිළිවෙත අනුව, සහල් නිෂ්පාදනය සඳහා පැරණි වී තොග ප්‍රථමයෙන්ම නිකුත් කළ යුතු වුවද, එය නොසලකා පැරණි තොග ගබඩාවේ තිබියදී, අලුත් වී තොග නිකුත් කර තිබුණ අවස්ථා විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත සම්මතයට පටහැනි ලෙස වටිනාකම රු. 73,548,914 ක් වූ පැරණි වී තොග කි. ග්‍රෑම් 2,626,113 ක් ගබඩාව තුළ තිබියදී, එය නොසලකා වටිනාකම රු. 85,048,150 ක් වූ අලුත් වී කි. ග්‍රෑම් 3,032,005 ක් නිකුත් කර තිබුණි.

(ii) පැරණි වී තොග නිකුත් නොකර ගබඩාව තුළ රඳවාගෙන තිබීම හේතුවෙන් පැහැය වෙනස් වීම, කෘමි හානි, තොග යල් පැනීම් හා නරක් වීම, තොග විනාශවීම, අපද්‍රව්‍ය මිශ්‍රවීම හා ඒවා නඩත්තුව සඳහා මණ්ඩලයට අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලයට අයත් ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල ගබඩා කර තිබූ සහල් පෞද්ගලික සමාගම් 04කට අඩු මිලට විකිණීම නිසා 2011 වර්ෂයේදී රුඃ මිලියන 369,49 ක අලාභ සිදුවී තිබුණි. මෙම විකිණීම මණ්ඩලය විසින් නොකළ බවත් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය මත ආහාර කොමසාරිස් විසින් කර ඇති බවත් මණ්ඩලයේ සභාපති විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) 1971 අංක 14 දරන වී අලෙවි මණ්ඩල පනතේ 3 සහ 10 වගන්ති ප්‍රකාර, වී සහ සහල් කෙටීමේ, පැහීමේ හා සකස් කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම හා පෞද්ගලික වී මෝල් ලියාපදිංචි කිරීම් කටයුතු ක්‍රියාත්මක කළ යුතුව තිබුණද, ඒ අනුව මණ්ඩලය කටයුතු කර නොතිබුණි. එමෙන්ම අවිධිමත්ව තෝරා ගත් වී මෝල් හිමියන් වෙත රුඃ 1,340,648,888 ක් වටිනා වී වර්ෂය තුළ නිකුත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රුඃ 67,706,816 ක් වටිනා වී තොගයට අදාල සහල් මණ්ඩලය වෙත ආපසු ලැබී නොතිබුණි. මෙම වී තොගය මූල්‍ය ප්‍රකාශනවල මාර්ගස්ථ තොග ලෙස දක්වා තිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය විසින් උපයෝජනය කරනු ලබන ගබඩා ගොඩනැගිලි සහ ඊට අයත් භූමි ප්‍රදේශ 142 ක අයිතිය තහවුරු කර ගැනීම සඳහාත්, බාහිර පාර්ශවයන් විසින් අනවසරයෙන් පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි 44 ක නිරවුල් භුක්තිය පවරා ගැනීම සඳහාත් සමාලෝචිත වර්ෂය තුළදී නීතිමය පියවරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු. 3,255,329 ක මුදලක් වී තොග රක්ෂණය කිරීම වෙනුවෙන් රක්ෂණ ආයතනයකට ගෙවා තිබුණද, රක්ෂණ ආයතනය ලබා දුන් උපදෙස් හා ප්‍රමිතීන්ට අනුව වී තොග ගබඩා නොකිරීම හේතුවෙන් වී තොගවලට සිදු වී තිබූ අලාභ හානි සඳහා වන්දි මුදල් ලබා ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

### 4.4 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බදු ගිවිසුමක් මත, බදු දී තිබුණ මණ්ඩලයට අයත් ගබඩා ගොඩනැගිලි 19 න් 07 ක ගිවිසුම් කාලය අවසන් වී තිබුණද මෙම ගොඩනැගිලි නැවත පවරා ගැනීමට හෝ බද්ද අලුත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් පැරණි බදුකරුවන් 2013 සැප්තැම්බර් 30 දින දක්වාත් ගෙවීමකින් තොරව ගොඩනැගිලි පරිහරණය කරමින් තිබුණි.

(ආ) එම ගොඩනැගිලි 19 න් 16 ක බදු කුලී සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හිඟ හිට තිබුණු අතර, හිඟ හිටි කුලිය රු. 5,173,950 ක් විය. මෙයින් රු. 3,641,250 ක් ම වර්ෂ 02 සිට 05 ට වැඩි කාලයක සිට හිටිව තිබුණි. මෙම හිඟ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර 2013 ඔක්තෝබර් 14 දින වන විටත් ගෙන නොතිබුණි.

(ඇ) ගබඩා ගොඩනැගිලි 04 කින් එකතුව රු. 3,036,400 ක් වූ පැරණි හිඟ හිටි බදු කුලී අයකර ගැනීමෙන් තොරව 2011 වර්ෂයට අදාළ බදු පමණක් අයකර තිබුණි.

(ඈ) මණ්ඩලයේ පූර්ව අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් විසින් ගොඩනැගිල්ලකට කරන ලද නවීකරණ කටයුතු වෙනුවෙන් වැය කර තිබූ රු. 6,314,659 ක් වූ මුදල බදු කුලියෙන් මාසිකව රු. 30,000 බැගින් හිලව් කිරීමට ඉඩ දී තිබුණි. ඒ අනුව මණ්ඩලයට අහිමි වූ මුළු බදු කුලිය රු. 360,000 ක් විය.

### 4.5 දාශ්‍ය අක්‍රමිකතා

මණ්ඩලය විසින් මෝල් හිමියන් වෙත නිකුත් කර තිබූ වී තොග සම්බන්ධයෙන් පහත සඳහන් අක්‍රමිකතා නිරීක්ෂණය විය.

(අ) මණ්ඩලය විසින් ගිවිසුම් ප්‍රකාරව මෝල් හිමියන් වෙත වී තොග නිකුත් කිරීමට පෙර පිළිගත් බැංකුවකින් දින 90ක වලංගු කාලයක් සහිතව කොන්දේසි විරහිත බැංකු ඇපකරයක් ලබාගත යුතු වුවද, කිසිදු මෝල් හිමියෙකු වෙතින් එවැන්නක් ලබාගෙන නොතිබුණි. මෙම බැංකු ඇපකරය වෙනුවට දිනයක්, වටිනාකමක් නොදක්වෙන හිස් චෙක්පත්, මණ්ඩලය විසින් ලබාගෙන රු. 1,340,648,888 ක් වටිනා වී මොවුන් වෙත නිකුත් කර තිබුණි. කෙසේ වෙතත්, මේ තුළින් රාජ්‍ය මුදල් අවභාවිතයට නොයෙදුනේය යන්න, විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ආ) සමහර මෝල් හිමියන් විසින් ඉදිරිපත් කර තිබූ චෙක්පත් සඳහා විවිධ හේතු මත බැංකු විසින් ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබුණි. එහෙත් මෙම මෝල් හිමියන්ට එරෙහිව කිසිදු නෛතික ක්‍රියාමාර්ගයක් 2013 ඔක්තෝබර් 14 දින වන විටත් ගෙන නොතිබුණි. නියැදි පරීක්ෂාවට අනුව, ගෙවීම් ප්‍රතික්ෂේප වූ චෙක්පත් වල වටිනාකම රුඃ 3,742,220 ක් විය.

(ඇ) වී තොග ගබඩාවලින් නිකුත් කිරීමේදී නිකුත් නියෝගවල පිටපත් හා ගබඩාවලින් නිකුත් කිරීමේ දී නිකුත් කුවිතාන්සි නිරන්තරව සංසන්දනය කොට ඊට අදාළ ඉදිරි ක්‍රියාමාර්ග නොගැනීම, නිසි වාර්තා තබා නොගැනීම, අවිධිමත් ආකාරයෙන් මෝල් හිමියන් තෝරා ගැනීම හා නිසි පාලන ක්‍රමවේදයන් හඳුන්වා නොදීම නිසා විවිධ ආකාරයේ වංචා හා අක්‍රමිකතාවලට ඉඩකඩ විවර කර තිබුණි.

## 4.6 අනාර්ථික ගණුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 වර්ෂයේ ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය විසින් වී විකිණීමෙන් ලැබූ මුදල් තැන්පත් කිරීම සඳහා ආරම්භ කර තිබුණු ඉතිරි කිරීමේ ගිණුම 2010 අප්‍රේල් 26 දින සිට මණ්ඩලය වෙත පවරා දී තිබුණු අතර, එදිනට ශේෂය රුː 5,338,284 ක් විය. එදින සිට 2013 සැප්තැම්බර් 30 දින දක්වා මෙම මුදල් ඵලදායි ආයෝජනයක යොදවා නොතිබුණි.

(ආ) ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ කොටස්වල, මණ්ඩලය විසින් ආයෝජනය කර තිබූ රුː 127,000 ක් වටිනා කොටස් 2011 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමකට බැර කර තිබූ අතර ඊට හිමි ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4.7 හඳුනාගත් පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු අයිරා හා ණය ශේෂයන් නොපියවීම මත සමාලෝචිත වර්ෂය තුළ අයිරා පොළී ලෙස රුː 22,380,293 ක් ද බැංකු ණය පොළී ලෙස රුː 307,263,860 ක් ද මණ්ඩලය විසින් වැය කර තිබුණි.

(ආ) පිරිවැය අධික වීම හේතු ලෙස දක්වමින් වී තොග වාර්ෂිකව සමීක්ෂණය කිරීමට මණ්ඩලය අතපසු කර තිබුණි. මිලදී ගත් වී තොග සම්පූර්ණයෙන්ම නිකුත් කිරීමෙන් අනතුරුව වී තොග ඌනතා ගණනය කිරීම මණ්ඩලයේ ක්‍රියාත්මක පිළිවෙත වී තිබුණි. කෙසේ නමුදු මණ්ඩලයේ වී මිලදී ගැනීමේ මෙහෙයුම් කටයුතු සක්‍රීය කර මණ්ඩලයේ කාර්ය මණ්ඩලය විසින් වී මිලදී ගැනීම ආරම්භ කර තිබුණු 2009/2010 මහ කන්නයේදී මිලදී ගත් වී තොග 2012 ජූනි 15 දින වන විට බොහෝ ගබඩාවලින් නිකුත් කර අවසන් කර තිබුණු අතර, එම කන්නයේ වී තොග ඌනතා ගණනය කිරීම විගණනයට කළ හැකි විය. ඒ අනුව, අනුරාධපුර කලාපයේ පරීක්ෂාවට ලක් කරන ලද ගබඩා 12ක වී තොග ඌනතාවය කි. ග්‍රෑම් 296,876 ක් විය. එහි පිරිවැය රුː 8,312,528 ක් විය. එහෙයින් මණ්ඩලයට අයත් අනෙකුත් ගබඩා 130 හි මෙවැනිම ඌනතා නොතිබේය යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 4.8 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 05 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 06 හා 15 ප්‍රකාර අභ්‍යන්තර විගණකවරයෙකු පත් කළ යුතු වුවත්, එතෙක් රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කළ යුතු වුවද ඊට අදාළ වාර්තා කිසිවක් 2013 සැප්තැම්බර් 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) නියෝග අංක 14 පරිදි 2008 වර්ෂයට පෙර සිට පැවතෙන හඳුනාගත නොහැකි හා අයකර ගත හැකි ණයගැති ශේෂ, හඳුනාගැනීමට කමිටුවක් පත් කර, එම කමිටුවේ

නිර්දේශ මත හා නිසි අනුමැතියක් මත ලියා හැර නව ශේෂ පත්‍රයක් සකස් කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත කී නියෝග ප්‍රකාර ඉදිරියට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හඳුනා ගත හැකි ස්ථාවර වත්කම් හා අනෙකුත් වත්කම් පිළිබඳ ලේඛන සකස් කිරීමට අපේක්ෂා කළ ද, විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අයිතම් සඳහාද විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කිරීමට මණ්ඩලය අපොහොසත් වීම හේතුවෙන් එම අවශ්‍යතාවය තවදුරටත් ඉටු වී නොතිබුණි.

## 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 134 ක් වුවද, 2011 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්තව සිටි කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ නිවැරදි තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(අ) මධ්‍ය කළමනාකරණ මට්ටමේ ප්‍රාදේශීය කළමනාකරු අනුමත තනතුරු සංඛ්‍යාව 07ක් වූ අතර, එම සියළු තනතුරු පුරප්පාඩුව පැවතුණි. එම තනතුරුවල වැඩ ආවරණය කිරීම සඳහා සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් පත් කර, වර්ෂ 03කට වැඩි කාලයක් ගතවී තිබුණද, එම තනතුරු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් වී තොග ගබඩා කිරීම සඳහා පරිහරනය කෙරෙන ගබඩා සංඛ්‍යාව 180 ක් පමණ වූ අතර, තොග පාලන කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීම වෙනුවෙන් සේවයේ යොදවා තිබුණු සහකාර ප්‍රාදේශීය කළමනාකාර හා ගබඩා සහකාර නිලධාරීන් සංඛ්‍යාව 78 ක් විය. නව තනතුරු අනුමත කරවා ගැනීම කෙරෙහි අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) මණ්ඩලයේ ප්‍රධාන විධායක තනතුරක් වන සාමාන්‍යාධිකාරි තනතුර සඳහා 2011 මැයි 03 දින නිලධාරියෙකු බඳවාගෙන තිබුණද, එය අවිධිමත් ලෙස සිදු කර තිබුණි. කෙසේ වෙතත්, මෙම තනතුරට අදාළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද සපුරා නොතිබීම මත මෙම පත්වීම මතභේදාත්මක පත්වීමක් වී තිබිණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සෑම මුදල් වර්ෂයක් සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 15ක ප්‍රමාදයකින් පසුව 2013 මැයි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 5.2 අයවැය පාලනය

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 ඡේදය පරිදි ආදායම් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ ප්‍රකාශය දැක්වෙන ලෙස අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. අයවැය ලේඛනයේ වියදම් වර්ගීකරණය ද මූල්‍ය ප්‍රකාශනවල වර්ගීකරණයට අනුරූපී නොවූ නිසා ඇස්තමේන්තුගත හා තථ්‍ය වියදම් අතර වූ විචලනයන් ගණනය කළ නොහැකි විය. ඒ අනුව, අයවැය ලේඛනය ඵලාදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර මණ්ඩලයේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) වත්කම් පාලනය

(ඈ) ගබඩා පාලනය

(ඉ) අයවැය පාලනය

(ඊ) කාර්ය මණ්ඩල

(උ) වී මෝල් හිමියන්ට බලපත්‍ර නිකුත් කිරීම.



**ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න**
වැඩබලන විගණකාධිපති

2014. 09. 01

PMB/F1/05/2013

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
අංක : 306/72
පොල්දූව පාර
බත්තරමුල්ල

**<u>වී අලෙවි මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබේ අංක ටීසී/ඊ/පීඑම්බී/එෆ්ඒ/2011 හා 2013.08.19 දිනැති විගණකාධිපති වාර්තාව හා බැඳේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

වී අලෙවි මණ්ඩලය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ මූලික අරමුණ වූයේ වී ගොවියාගේ නිෂ්පාදනයන් සඳහා ඉහළ මිලක් ලබා දෙමින් එම මිල වෙළඳපොළ තුළ ස්ථාපිත කොට පෞද්ගලික වී මෝල් හිමියන් එම වී අලෙවි මණ්ඩලයේ සහතික මිල ගණන් ඉක්මවා යන මිලක් වෙළඳපොළ තුළ ක්‍රියාත්මක කරවීම තුළින් වී ගොවියාට තම වී සඳහා ඉහළ මිලක් ලබා දී වී ගොවියා ආරක්ෂා කර ගැනීමත් වෙළඳපොළේ වී හිඟයක් ඇති වූ විටෙක වී මිල ඉහළ යෑම හරහා සහල් මිල ඉහළ යෑම හේතුවෙන් ජනතාවගේ ජීවන වියදම ඉහළ යෑම පාලනය කිරීමේ උපක්‍රමයක් ලෙස වී අලෙවි මණ්ඩලය ගබඩා කොට ඇති වී වෙළඳපොලට නිකුත් කොට සහතික මිලට වෙළඳපොලේ සහල් සුලභ කිරීමත්ය.

ඒ අනුව රජය අපේක්ෂා කරනුයේ වී අලෙවි මණ්ඩලය හරහා බහුතර ජනතාවගේ සුභසිද්ධිය සැලසීම වන අතර ලාභ ඉපයීම නොවේ. වී අලෙවි මණ්ඩලය සම්බන්ධව ඇතිවන ද්‍රවශීලතා ගැටලු වලදී මහා භාණ්ඩාගාරය ඉදිරිපත් වී කටයුතු කරන නිසා එවැනි අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ගැටලු පැන නොනගිනු ඇත.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 05 අනුව වී තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් අඩුම අගයට තොග අගය කළ යුතු වුවද, 2011.12.31 දිනට භෞතික තොග ගණනයක් සිදු කිරීමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන අතර හා අපගේ කාර්ය මණ්ඩලයේ හිඟතාවය මත එසේ කිරීමට හැකියාව නොමැති හෙයින් ප්‍රාදේශීය කළමනාකරුවන්ගේ වාර්තා අනුව පිරිවැය මත තොග ගණනය කිරීමට සිදුවිය.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව පාරිතෝෂික දීමනා සඳහා ප්‍රතිපාදන වෙන් වෙන් කර 2012 වර්ෂයේ සිට ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ඇත.

(ඇ) වී අලෙවි මණ්ඩලයට අයත් ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනයකට ලක්කොට නොමැති බැවින් ඉඩම් හා ගොඩනැගිලිවල අගයන් වෙන් වෙන්ව හඳුනාගත නොහැකි වී ඇත. වී අලෙවි මණ්ඩලයට අයත් නිශ්චිත දේපළ හඳුනාගැනීම මේ වනවිට නීති අංශය මඟින් සිදු කරන බැවින් ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනයකට ලක්කොට වෙන් වෙන්ව ස්ථාවර වත්කම් නිරවද්‍ය කිරීමට කටයුතු කරමි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ පොදු කාරක සභාවේදී පෙන්වා දුන් පරිදි 2009 වර්ෂයට පෙර සියලුම වත්කම් හා වගකීම් අවිනිශ්චිත ගිණුමක රැඳවීමට තීරණය කරන ලදි. ඒ අනුව කටයුතු කර ඇති අතර, සඳහන් කර ඇති අගයන් නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලදී.

(ආ) වී අලෙවි මණ්ඩලය සතු වී භාවිත කොට වෙළඳපළේ සහල් මිල ස්ථාවර කිරීම අරමුණු කරගෙන වී කෙටීම වෙනුවෙන් දැරූ වියදම් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරන ලදී. එය ආදායමක් ලෙස සටහන් වී ඇත්තේ සත්‍ය වශයෙන්ම වැඩිපුර ලැබීමක් නිසාවෙනි.

(ඇ) නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරමි.

(ඈ) මෙම සහල් තොග ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ගබඩාවල තැන්පත් කළ අතර, එය අමාත්‍යාංශයේ උපදෙස් මත ආහාර කොමසාරිස් විසින් අලෙවි කර, වී අලෙවි මණ්ඩලයට එම මුදල් අමාත්‍යාංශය හා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ලබාදී ඇත. ඒ අනුව විකුණුම් ලෙස සටහන් කරන ලදී.

(ඉ) වැටුප් හා ප්‍රාග්ධන වියදම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය විසින් ලබාදෙන අතර, එය අනෙකුත් ලැබීම් ලෙස ගිණුම් ගත කරන ලදී.

(ඊ) ලැබිය යුතු මුදල් ලෙස රු. 3,697,500 ක මුදලක් ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි.

(උ) නිවැරදි පරිදි ගිණුම් ගත කොට ඇත.

(ඌ) වී අලෙවි මණ්ඩලය සතු වී අලෙවි කරනුයේ රාජ්‍ය ආයතනවලට බැවින් අදාළ මුදල් සියල්ලම ලැබෙන බවට තහවුරුවක් ඇත. එබැවින් බොල් ණය වෙන් කිරීමක් කිසිදු වර්ෂයක සිදු කර නොමැත.

### 2.2.4 ලැබිය යුතු ගිණුම්

(අ) මේ වනවිට විශාල මුදලක් අයකරගෙන ඇති අතර, සමාලෝචිත ගිණුම් වර්ෂය තුළ අයකිරීම් සිදුව නොමැති බැවින් එම ශේෂයන් පෙන්නුම් කරයි.

(ආ) ණය අයකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කළද, නිසි පරිදි ගෙවීම් නොකර ඇති බැවින් එම ශේෂයන් ඉතිරිව ඇත. එහෙත් මේ වනවිට බොහෝ ණය අයකර ගැනීම් කටයුතු සිදු වෙමින් පවතී.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

විගණනය සඳහා අප වෙතින් ඉල්ලා තිබූ විස්තර විගණන විමසුම් වලට පිළිතුරු ලෙස ඉදිරිපත් කළ අතර විශේෂයෙන් අප වෙතින් ඉල්ලා තිබූ විස්තර ඒ ඒ අවස්ථාවේදී ලබා දෙන ලදී. කෙසේ වෙතත් විගණනය සඳහා සාක්ෂි නොවීම යටතේ ඔබ විසින් දක්වා ඇති අයිතමයන් සම්බන්ධයෙන් පහත පැහැදිලි කිරීම් ඔබගේ කාරුණික අවධානය සඳහා ඉදිරිපත් කරමි.

| ගිණුම් විෂය | වටිනාකම රු. | පැහැදිලි කිරීම |
|---|---|---|
| ස්ථාවර | 13,710,714 | 2011 වර්ෂයේ ගිණුම් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු සපයන ලද 2013.09.12 වන විට ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කරමින් තිබූ අතර ඒ සම්බන්ධයෙන් |

| | | |
|---|---|---|
| | | විශ්ලේෂණයන් මේ වන විට අවසන් කොට ඇත. ඒ අනුව 2008 වර්ෂයෙන් පසු මිලදී ගත් සහ ගොඩනංවන ලද ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කරමින් පවතී.<br><br>කෙසේ වෙතත් ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම නිරාකරණය කර ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලය කටයුතු කරමින් පවතී. |
| වී, සෝයා බෝංචි සහල් සහ<br>**මාර්ගස්ථ වී තොගය**<br>වී තොගය | <br><br><br>4,483,918,739 | <br><br><br>ඉහත වී තොගය වී අලෙවි මණ්ඩලය විසින් ගබඩා 200 ක පමණ ගබඩා කර ඇත. දළ වශයෙන් සලකා බැලූ විට ගබඩාවල වී කිලෝ මෙට්‍රික් ටොන් 154,617 ක් පමණ ගබඩා කොට ඇත. එය කිලෝ ග්‍රෑම් 50 ක වී මලු ලෙස ගත් කළ 3,092,340 කි. මෙවැනි විශාල වී ප්‍රමාණයක් භෞතිකමය වශයෙන් සත්‍යාපනය කිරීම ප්‍රායෝගිකව ඉතා අසීරු කාර්යක් වන අතර සේවක මණ්ඩල හිඟකමද එවැන්නක් ක්‍රියාත්මක කිරීම සඳහා බාධකයක්ව පැවතුනි. එසේම දැරිය යුතු පිරිවැයද අධික වන හෙයින් භෞතික තොග සත්‍යාපනය ඒ අවස්ථාවේදී කිරීමට හැකියාවක් නොමැති විය.<br><br>කෙසේ වෙතත් 2014 පෙබරවාරි මස වන විට වී කිලෝ මෙට්‍රික් ටොන් 4292.9 (අබලි වී ද ඇතුළුව) ගබඩාවල පැවති අතර සහ ඒ වන විට නවක නිළධාරීන් 60 දෙනෙකු පමණ සේවයට බඳවා ගෙන තිබූ හෙයින් වී අලෙවි මණ්ඩලය සතු සියලුම ගබඩා වල ගබඩා කොට ඇති වී තොග භෞතිකමය වශයෙන් සත්‍යාපනය කොට සත්‍ය වශයෙන්ම ගබඩා වල පවතින තොග ප්‍රමාණයන් සහ ඒවායේ තත්වය නිර්ණය කොට ඇත. ගබඩා පොත් ශේෂයන් සහ භෞතික තොගය අතර පිළිගත නොහැකි විචලනයන් ඇති අවස්ථාවන් සම්බන්ධයෙන් ඒ සඳහා වගකිව යුතු නිළධාරීන්ගෙන් කරුණු විමසා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |
| සෝයා බෝංචි තොගය | 3,302,853 | සෝයා බෝංචි තොගය ගිණුම් වර්ෂය ආරම්භයේදී 1,534,988 kg ක් වූ අතර වර්ෂය තුළ මිලදී ගැනීම් 60,869 kg ක් විය. ඒ අනුව විකිණීම සඳහා සූදානම් කළ තොග ප්‍රමාණය 1,595,837 kg කි. එයින් වර්ෂය තුළ 1,557,000 kg ක් විකුණා ඇති අතර 2011.12.31 දිනට පොත් ශේෂය ලෙස දක්වන 38,857 kg වටිනාකම වන රු. 3,302,853/= සෝයා බෝංචි තොගය ලෙස අවසන් ගිණුම් වල පෙන්වා ඇත. නමුත් එදින වන විට භෞතික තොග කිසිවක් පැවති නැති අතර පොත් ශේෂය ලෙස දක්වන ලද ප්‍රමාණය, වියළි බර අඩු වීම ලෙස පසුව අනාවරණය වී ඇත. |
| මාර්ගස්ථ වී තොගය | 67,706,816 | සහල් අපනයනය කිරීම සහ ලෝක ආහාර වැඩසටහන යටතේ සහල් ලබා දීම පිණිස මෝල් හිමියන් වෙත නිකුත් කළ එහෙත් ඒ වන තෙක් සහල් ලබා දී නොතිබූ වී තොග මාර්ගස්ථ වී තොගය ලෙස දක්වා ඇත. මෙම වී නිකුත් කිරීම සම්බන්ධයෙන් අදාළ තොග නිකුත් කිරීමේ කුවිතාන්සි ඒ ඒ මෝල් හිමියාගේ |

| | | |
|---|---|---|
| | | ලිපිගොනු වල ඇතුළත් කොට ඇත. එම ලිපිගොනු වල ඇතුළත් තොග නිකුත් කිරීමේ කුවිතාන්සි පරීක්ෂා කිරීම මගින් එම මාර්ගස්ථ තොගයේ වටිනාකම පරීක්ෂා කර ගැනීමට හැක. |
| සහල් තොගය | 152,842 | අවසන් තොගය ලෙස දක්වා ඇති සහල් නාරාහේන්පිට සහල් අලෙවිසැලේ පැවති සහල් තොග වේ. එම සහල් තොගය භෞතිකව සත්‍යාපනය කොට නොතිබුනි. |
| කාර්යාල ලිපි ද්‍රව්‍ය තොගය | 110,639<br><br>**4,555,191,889** | කාර්යාල ලිපි ද්‍රව්‍ය තොගය ලෙස දක්වා ඇත්තේ මුද්‍රිත පෝරම, තොග පොත්, සහ වෙනත් එවැනි මුද්‍රණය කර ගත් ලිපි ලේඛන වේ. ඒවා සම්බන්ධයෙන් තොග ලේඛන පවත්වාගෙන යනු ලැබේ. |
| සහල් වී සහ සෝයා බෝංචි විකුණුම් ණය ගැතියෝ | **1,086,844,771** | මෙම විකුණුම් ණය ගැතියන් ලෙස ඉදිරිපත් කර ඇත්තේ ආහාර දෙපාර්තමේන්තුව ඇතුලු රජයේ ආයතන වලට සහල් ලබා දීම වෙනුවෙන් සහ සමූපකාර තොග වෙළඳ සංස්ථාවට ලබා දීම මගින් උපචිත වූ ලැබීම් වේ. මෙම මුළු වටිනාකමෙන් වැඩි ප්‍රතිශතයක් 2011 වර්ෂයේ විකුණන ලද විකුණුම් සම්බන්ධයෙන් වන අතර ඉතිරිය 2010 වර්ෂයේදී සිදු කළ විකුණුම් සම්බන්ධයෙනි. ඉදිරි වර්ෂ වලදී කාල විශ්ලේෂණය හා ශේෂය සනාථ කිරීමේ ලිපි ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |
| බැංකු ණය හා භාණ්ඩාගාර අත්තිකාරම් | **5,487,454,030** | මෙහි බැංකු ණය ලෙස ඇතුළත් වී ඇත්තේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ මහා භාණ්ඩාගාරය වෙතින් වී මිලදී ගැනීම සඳහා ලබා දී ඇති ණය ප්‍රමාණයන්ය. මහා භාණ්ඩාගාරය විසින් වී මිලදී ගැනීම සඳහා 2010 වසරේ බිලියන 1.3 ලබා දී ඇති අතර එය 2011 වර්ෂයේදී මිලියන 600 කි. වී අලෙවි මණ්ඩලය 2011 වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අවසන් මූල්‍ය වාර්තා යටතේ සටහන 19 මගින් මෙම සංඛ්‍යා ඉදිරිපත් කර ඇත.<br><br>ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙතින් ලබා ගෙන ඇති ණය මුදල් වී මිලදී ගැනීම සඳහා යොදා ගනු ලබන අතර එම වී විකුණා ලැබෙන මුදල් එම ගිණුම් වලට නැවත තැන්පත් කරනු ලබයි. ඒ අනුව නිතිපතා උච්චාවචනය වන ශේෂයන්ගෙන් මෙම ගිණුම් සමන්විත වන හෙයින් කාල විශ්ලේෂණයන් සැකසීම ප්‍රායෝගික නොවේ. තවද ඒ ඒ බැංකු වෙනුවෙන් වී අලෙවි මණ්ඩලය විසින් පවත්වාගෙන යන ලිපිගොනු වල ඒ ඒ බැංකු වලින් ලබා ගත් මාසිකව ලැබෙන බැංකු වාර්තා ඇතුළත් කර ඇති අතර 2011 දෙසැම්බර් මාසයේ බැංකු වාර්තාවේ අවසන් ශේෂය, ශේෂ සනාථ කිරීම ලෙස සැලකිය හැකි බව කාරුණිකව දන්වා සිටිමි. |
| බැංකු අයිරාව | **247,131,449** | 2011 වර්ෂයේදී ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා ඉතා විශාල මුදලක් අවශ්‍ය වූ අතර ඉතා කෙටි කලකින් එනම් දින |

| | | |
|---|---|---|
| | | කිහිපයකින් එම මුදල් සම්පාදනය කර ගැනීමට අවශ්‍යතාවය ඇති අතර ඒ අනුව බැංකු අයිරා ආවරණ අනුමැතිය ලබා ගැනීමේ පදනමින් පහසුකම ලබා ගෙන පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. එසේ කඩිනම් පියවර නොගත්තේ නම් ගොවියන්ට මුදල් ගෙවීමට නොහැකි වීම මත ගොවි උද්ඝෝෂණ ආදී තත්වයන්ට අයතනයට මුහුණ දීමට සිදු විය හැකිව තිබුණි.<br><br>එම බැංකු අයිරාව ලබා ගත් ගිණුමේ ගණුදෙනු ඇතුළත් 2012 දෙසැම්බර් මාසයේ බැංකු ප්‍රකාශය ශේෂ තහවුරුවක් ලෙස ලබා දුන් අතර විශේෂ වශයෙන් ලබා ගත් ශේෂ සනාථ කිරීමේ ලිපියක් ලබා දී නැත. බැංකු අයිරාවක් ලබා ගෙන එමගින් වී මිලදී ගැනීමේ කටයුතු සිදු කිරීම කාල විශ්ලේෂණයකට ඇතුළත් කර නොමැති නමුත් එම අයිරාව ලබා ගත් කාලය සහ එය ප්‍රයෝජනයට ගත් ආකාරය බැංකු ප්‍රකාශන මගින් පැහැදිලි කරනු ඇත. |
| ආයෝජන | **283,044,402** | 2009 වර්ෂයේ මෙම ස්ථාවර තැන්පතුව ආරම්භ කර ඇත. එම ස්ථාවර තැන්පතුව බැංකුව භාරයේ තබා බැංකු අයිරා මුදලක් ලබා ගෙන තිබූ හෙයින් එම ආයෝජන සහතික විගණනය සඳහා ඉදිරිපත් කළ නොහැකි විය. |
| ආයෝජන පොළී ආදායම් | **14,549,943** | බැංකුව විසින් ස්ථාවර තැන්පතුව සඳහා ගෙවන පොළී අනුපාතය සහ එම තැන්පතුව තිබූ කාලය පාදක කොටගෙන පොළිය ගණනය කොට ඇත. මෙම ගණනය කිරීම් අපගේ මූල්‍ය වාර්තා සම්බන්ධව පිළියෙල කළ ලිපි ගොනුවේ ඇත. |

### 2.2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) අභ්‍යන්තර විගණකවරයකු නොමැති නිසා මෙම කාර්ය සමාලෝචිත වර්ෂයේදී ඉටුකළ නොහැකි වුවද, දැනට අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය විධිවිධාන යොදා ඇත. ඒ අනුව ඉදිරියේදී එම කරුණු නිවැරදි වනු ඇත.

(ආ) (i) 2011 සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය සම්පූර්ණ කර ගැනීමට අවකාශයක් නොවූ බැවින් එලෙස වුවද ඉදිරියේදී එය නිවැරදි කිරීමට කටයුතු කොට ඇත.

(ii) පෞද්ගලික සහල් මෝල් කරුවන් ලබාගත් වී වෙනුවෙන් ඉදිරිපත් කළ චෙක්පත් වන අතර දැනට මේ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.

(iii) මෙය ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. බොහෝවිට අයිරා සිදුව ඇත්තේ ගොවීන්ගෙන් මිලදී ගන්නා වී සඳහා ගෙවීම් කිරීම හේතුවෙනි. අයිරා පහසුකම් ලබාගෙන ඇත්තේ වී අලෙවි මණ්ඩලය නමට පවතින ස්ථාවර තැන්පත් ගිණුම් උපයෝගී කර ගෙනය.

(ඇ) ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරිය සතුව පැවති වත්කම් හා වගකීම් වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගෙන ඇත.

(ඈ) (i) කෙටුම්පත් වාර්ෂික වාර්තාව සකස් කර ඇත.

(ii) අභ්‍යන්තර විගණකවරයෙකු බඳවා ගැනීමට අවශ්‍ය විධිවිධාන ගෙන ඇති අතර, එතෙක් 2012 වර්ෂයේදී එක් විගණක හා කළමනාකරණ කමිටු රැස්වීමක් පවත්වන ලදී.

(ඉ) ස්ථාවර වත්කම් සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂය වන විට සිදු කර නොමැති වුවද 2012 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. තවද වී මිලදී ගන්නා කාලයේදී ඇතිවන ප්‍රමාදයන් නිසා අවසන් කර ගත නොහැකි වුවද එය ඉදිරි මාසයේදී අවසන් කිරීමට නියමිතය.

(ඊ) භාණ්ඩාගාරයෙන් ලබාදී ඇති මෙම මුදල ප්‍රාග්ධනිත කිරීමට උපදෙස් ලැබී ඇති අතර මීට පෙර භාණ්ඩාගාරයෙන් ලබාගත් අත්තිකාරම් මුදල් නිසි පරිදි පියවීම් කර ඇත.

(උ) මෙම කටයුතු නිවැරදි කිරීමට අවශ්‍ය නියෝගයන් අදාළ නිලධාරීන් වෙත ලබාදෙන ලදී. ඒ අනුව අදාළ ලිපිගොනු සම්පූර්ණ කර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ඔවුන්ව දැනුවත් කළ අතර දැනට එම කටයුතු නිවැරදි කරමින් පවතී.

(ඌ) ඉහත කරුණම වේ.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය සමාලෝචනය

#### 3.1.1 මූල්‍ය ප්‍රතිඵල

මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සිදුව ඇති සත්‍ය ගනුදෙනු මගිනි. කෙසේ වුවද වී අලෙවි මණ්ඩලය ලාභ අරමුණු කරගෙනම ස්ථාපිත කරන ලද ආයතනයක් නොවන අතර මූලික පරමාර්ථය වී ඇත්තේ වී ගොවියාගේ වී නිෂ්පාදනය සඳහා වෙළඳපළක් නිර්මාණය කරදීමටයි. පසුගිය වර්ෂ කිහිපයක් තිස්සේ සහල් මිල වැඩි නොවීම සහ වී ගොවියාට සාධාරණ මිලක් ලැබීම තුළින් වී අලෙවි මණ්ඩලය තම අරමුණු සාක්ෂාත් කරගෙන ඇති බව තහවුරුය.

#### 3.1.2 වියදම්වල අසාමාන්‍ය වැඩිවීම

වී අලෙවි මණ්ඩලය සතුව විශාල ප්‍රාග්ධනයක් නොමැති අතර මහා භාණ්ඩාගාරය බොහෝ විට වැටුප් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන අතර වී මිලදී ගැනීම සඳහා බැංකු මඟින් මූල්‍ය පහසුකම් ලබාගැනීමට අනුමත ප්‍රමාණයන් තීරණය කරනු ලබයි.

ඒ අනුව විශාල මූල්‍ය පිරිවැයක් දැරීමට සිදුව ඇත්තේ එම තොගයන් අලෙවි කර ගැනීමේ බාධකයන් පවතින බැවිනි. එම විගණන විශ්ලේෂණයන් දක්වා ඇති පරිදි එම දත්තයන් නිවැරදි වුවද රාජ්‍ය ප්‍රතිපත්තිය වී අලෙවි මණ්ඩලය නිවැරදිව ඉටු කොට ඇත.

#### 3.1.3 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආහාර සුරක්ෂිතතාවය හා ජීවන වියදම් කමිටුවේදී ගත් තීරණ අනුව හා අමාත්‍ය මණ්ඩල තීරණ අනුව හා රටේ ආහාර අවශ්‍යතාවය අනුව අප අමාත්‍යාංශයේද ලේකම්ගේ උපදෙස් අනුව වී නිකුත් කිරීමට හා ඊළඟ කන්නයේ වී මිලදී ගැනීම සිදු කළ අතර, මෙය හුදෙක් ගොවියා ආරක්ෂා කරගෙන රටේ ආහාර සුරක්ෂිතතාවයද ඇතිකිරීමේ පියවරක් අනුව කටයුතු කර ඇත.

ජාතික කර්තව්‍යයක් ඉටු කර ගැනීම සඳහා පිහිටුවන ලද වී අලෙවි මණ්ඩලයේ ප්‍රධාන අරමුණු හා පරමාර්ථ වනුයේ ගොවියාට හොඳ මිලක් ලබාදෙමින් ගොවියා ආරක්ෂා කිරීමත්, පාරිභෝගිකයා සඳහා අවශ්‍ය ආහාර සුරක්ෂිතතාවය ඇති කරමින් අඩු මුදලට ගුණාත්මක බවින් යුත් කෘෂි නිෂ්පාදන සාධාරණ මිලකට පාරිභෝගිකයාට

ලබාදීමත් යන කරුණුය. ඒ අනුව එම අරමුණු හා පරමාර්ථ 2 කම ඉටු කිරීමට කටයුතු කර ඇත.

ජීවන වියදම් හා ආහාර සුරක්ෂිත කමිටුවේ හා අමාත්‍යාංශයේ උපදෙස් අනුව මෙම සියලුම කාර්යයන් ඉටු කර ඇත. ගොවියාට වී සඳහා වෙළඳපළේ පවතින මිලට වඩා වැඩිමිලක් ලබාදෙමින්, ගොවියා ශක්තිමත් කර ඇති අතර, පාරිභෝගිකයාට අඩු මිලට සහල් සපයා ඇත. මෙම කාර්යයන් දෙකම සාක්ෂාත් කරගත් විට ලාභ ඉපයීමේ හැකියාවක් නොමැති බව සත්‍යයකි. එසේ වුවද සමාජීය ලාභය එනම් ජීවන මිල දර්ශකයද මෙම හේතුවෙන් පහත වැටී ඇත. සමාජීය ලාභය ගණනය කළ හැකි නම් බොහෝ විට වී අලෙවි මණ්ඩලය ලාභදායී ආයතනයක් වනු නිසැකය.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 කාර්ය සාධනය

(අ) වී අලෙවි මණ්ඩලය විවෘත වෙළඳපොළේ වී මිලදී ගැනීම සඳහා සහභාගි වන අතර, සමහර අවස්ථාවලදී වෙළඳපොළ තුළ සහතික මිලට වඩා මිල වැඩි අවස්ථාවලදී වී අලෙවි මණ්ඩලයට සහතික මිලට වී මිල දී ගැනීමට නොහැකි වේ. නමුත් වී අලෙවි මණ්ඩලය බලාපොරොත්තු වන පරමාර්ථය වන ගොවියාට ඉහළ මිලක් ලබාදීම ඒ තුළින් ඉටු වී ඇත.

(ආ) (i) සමහර අවස්ථාවලදී ගබඩාවල ඉඩ පහසුකම් ලබා ගැනීම හා අලුතින් නිෂ්පාදන මිලදී ගැනීමට අවශ්‍ය වූ විට එම අලුත් වී නිකුත් කිරීමට සිදුවේ. තවද වී වර්ග අනුව සම්බා, රතු නාඩු හා සුදු නාඩු වශයෙන් වෙළඳපොළේ ඉල්ලුම අනුවද නිකුත් කිරීමට සිදුවන බැවින් ගබඩාවල පරණ හා අලුත් වී ලෙස නොසලකා නිකුත් කිරීමට සිදු වේ.

(ii) මිල ඉහළ ගියත් වී මිල ඉතා ඉහළ යනුයේ අවශ්‍ය තරම් නිෂ්පාදන නැති විටය. මේ වන විට සහල් මිල ඉහළ යන බැවින් එය පාලනය කිරීම සඳහා අඩු මිලට සහල් ලබා දීම සඳහා වී නිකුත් කිරීමට සිදුවේ. එවිට වැඩියෙන් ඉල්ලන වී වර්ග එනම් සුදු නාඩු හා සම්බා නිකුත් කිරීමට සිදුවන අතර ඉල්ලුම අඩු රතු වී වර්ග සමහර අවස්ථාවලදී ගබඩාවල ඉතිරි වීමට ඉඩ ඇත.

(iii) වී අලෙවි මණ්ඩලයට අවශ්‍ය අවස්ථාවන්හිදී වෙළඳපොළට වී නිකුත් කිරීමට හෝ විවෘත වෙළඳපොළේ පවතින මිලට වී මිලදී ගැනීම සිදු කළ නොහැකිය. මෙය ජාතික කර්තව්‍යයක් ඉටු කරන ආයතනයකි. විගණන නිර්දේශ පිළිගන්නා අතර එලෙස ක්‍රියාත්මක විය හැකි නම් ලාභ ලැබිය හැකි බවද දැක්විය හැක.

### 3.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

(i) පාඩු ලැබීමට හේතු වූ කාරණා මෙන්ම අලාභ අවම වන පරිදි කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ යෝජනා ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.

(ii) වී මිලදී ගනු ලබන්නේ විවෘත වෙළඳපොළේ පවතින මිලට වඩා රජය විසින් සහතික කරන ලද මිලකටය. වී අලෙවි මණ්ඩලය ක්‍රියාත්මක වනුයේ ස්වාධීන ආයතනයක් ලෙසට නොවන බැවින් අවශ්‍ය විටෙක වී විකිණීමට හෝ කුමන හෝ මිලකට වී මිලදී ගැනීමේ ක්‍රියාවලියකට යාමේ හැකියාවක් නොමැත. කෙසේ වුවද වී විකිණීම සඳහා පුවත්පත් දැන්වීම් වාර 3 කට වඩා ඉදිරිපත් කර

විකුණා ඇති අතර, මේ වන විට පෞද්ගලික මෝල් හිමියන් වෙත ලබාදී තිබූ වී වෙනුවෙන් මණ්ඩලයට ලැබිය යුතු මුදල් අයකර ගනිමින් පවතී. නොගෙවන මෝල් කරුවන්ට විරුද්ධව නීතිමය කටයුතුද ආරම්භ කර ඇත.

(iii) මෙම විකිණීම් සිදුකර ඇත්තේ අමාත්‍යාංශයේ නිසි අනුමැතිය මතය. එම විකිණීම් කටයුතු ආහාර කොමසාරිස් විසින් කර ඇති අතර, වී අලෙවි මණ්ඩලය මඟින් සිදුකර නොමැත.

(iv) වී අලෙවි මණ්ඩලයේ 2011 වර්ෂයේ දී පැවති පුරප්පාඩු හේතු කොට ගෙන කාර්යයන් විධිමත් පරිදි සිදු නොවුනු සමහර අවස්ථා පැවතියද, වර්තමානය වන විට ඒවා නිවැරදි කර ඇත. පෞද්ගලික වී මෝල් ලියාපදිංචි කටයුතු නීති අංශය මඟින් මේ වන විටත් ආරම්භ කර ඇති අතර නිකුත් කිරීම් නියමිත අධිකාරී බලයක් යටතේ සිදු කරමින් පවතී.

තවද මහින්ද චින්තන පරමාර්ථ අනුව දැනට අක්‍රීයව වී මෝල් නැවත ප්‍රතිසංස්කරණය කිරීමේ පරමාර්ථය ඇතිව අමාත්‍යාංශයේ තීරණ මත කුඩා හා මධ්‍යම පරිමාණයේ වී මෝල්වලට වී ලබාදුන් අතර එම පරමාර්ථය වූයේ එම වී මෝල් ප්‍රතිසංස්කරණය කර ඔවුන්ටද ආර්ථික හැකියාවක් ලබාදීමයි. මේ සඳහා බලාපොරොත්තු වූ සමහර මෝල් මඟින් එම කටයුත්ත සිදු වූ අතර, සමහර මෝල්වලින් එය සිදු නොවිණි. නමුත් නිසියාකාරව සහල් ආපසු භාර නොදුන් සහල් මෝල් හිමියන්ට එරෙහිව මේ වනවිට නීතිමය කටයුතු සිදු කරමින් පවතී.

## 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(i) වී අලෙවි මණ්ඩලයට අයත් ගබඩා සහ ඊට අයත් භූමි ප්‍රදේශ අයිතිය තහවුරු කර ගැනීම සඳහා දැනට කටයුතු කරගෙන යමින් පවතී. වී අලෙවි මණ්ඩලය අක්‍රීයව පැවති කාලයේදී අනවසරයෙන් භාවිත කරනු ලැබූ ගොඩනැගිලිවල නිරවුල් භුක්තිය පවරා ගැනීමට අදාළ කටයුතු විධිමත් පරිදි මෙම වර්ෂයේ දී නිම කරන ලෙස නීති අංශයට දන්වා ඇත.

(ii) වී අලෙවි මණ්ඩලයේ පවතින බොහොමයක් ගබඩා වර්ෂ 30 ට පමණ පෙර ඉදිකළ හා වර්ෂ ගණනාවක් නඩත්තු නොකළ ගබඩාවල වී රැස් කිරීම ප්‍රමිතියෙන් යුක්ත නොවේ. ප්‍රමාණවත් ඉඩපහසුකම් මෙන්ම ගබඩාවලට අවශ්‍ය යටිතල පහසුකම් ලබාදීමේ අවම හැකියාව නිසා ලබාදෙන උපදෙස් හා ප්‍රමිතීන්ට අනුව ගබඩා කිරීමේ හැකියාවක් ප්‍රායෝගිකව නොමැත. තවද භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාදෙන ආකාරයට මෙම ගබඩා ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු කරගෙන යමින් පවතී.

## 3.6 අවිධිමත් ගනුදෙනු

(අ) වී අලෙවි මණ්ඩලය 2008 වර්ෂයේදී නැවත ස්ථාපිත කිරීමට ප්‍රථම ගබඩා හා ගොඩනැගිලි බදු දීම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් සිදුකර ඇත. ඒ අනුව මෙම ගොඩනැගිලි වී අලෙවි මණ්ඩලය නමින් පැවතුනද නීත්‍යානුකුල පැවරීමක් සිදු කර නොමැති අතර, මේ වන විට ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

තවද වී අලෙවි මණ්ඩලයට අයත් ගොඩනැගිලිවලින් දැනටමත් වරාවැව ගබඩා සංකීර්ණය පවරා ගෙන ඇති අතර, ඉතිරි ගබඩා සියල්ලම වී අලෙවි මණ්ඩලය වෙත පවරා ගැනීමට හෝ බදු ගිවිසුම් අලුත් කිරීමට කටයුතු කරමින් පවතී.

(ආ) ඉහත (අ) පිළිතුරෙහි පළමු ඡේදයේ සඳහන් කටයුතු නිම වූ වහාම අදාළ හිඟ බදු අයකර ගැනීමට කටයුතු කරමි.

(ඇ) 2011 වසරේ දී එම මුදල් අයකර ගැනීමට කටයුතු සිදු කර ඇති අතර, ඉදිරියේදී ඒ පිළිබඳ තවදුරටත් සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු සකස් කරමින් පවතී.

(ඈ) වී අලෙවි මණ්ඩලය විසින් පඬුවස්නුවර ගබඩා සංකීර්ණය බදු දීමේ දී ඇති කර ගන්නා ලද 2009 සැප්තැම්බර් 28 දිනැති ගිවිසුමට අනුව මෙම සමාගම විසින් ගබඩාව නවීකරණය කිරීමේදී දරන ලද වියදම සඳහා මාසිකව රු. 30,000/= ක මුදලක් අඩුකර ගැනීමට ඉඩ දී ඇති අතර, මාසික කුලිය වන රු. 40,000/= මුදලින් ඉහත මුදල අඩු කර ඉතිරි මුදල වන රු. 10,000/= මුදල මණ්ඩලය වෙත ගෙවිය යුතු බව දන්වා ඇත. එවිට අහිමි බදු වූ කුලිය වන්නේ රු. 360,000/= කි. මෙම මුදල අය කර ගැනීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

## 3.7 අධිකාර බලය නොලත් ගනුදෙනු

එකී ගනුදෙනුව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම සිදු නොවුනද, කෙටුම් කුලී ගාස්තු ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොමැතිකමින්, ගබඩා හිස් කර ගැනීමේ අරමුණින් ඒ සඳහා වී නිකුත් කිරීමට කටයුතු කළ අතර අමාත්‍යංශයේ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ඇත.

## 3.8 දෘශ්‍ය අක්‍රමිකතා

(අ) ගිවිසුම් ප්‍රකාරව බැංකු අණකරයක් ගෙන කටයුතු කිරීමේදී සහල් මෝල් හිමියන් තුන් දෙනෙක් පමණක් ඉදිරිපත් වූ අතර, අමාත්‍යාංශයේදී 2010. 12. 10 දින ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අමාත්‍යාංශ ලේකම් තුමා සහ අනෙකුත් නිලධාරීන්ගේ රැස්වීමේදී අවශ්‍ය තරම් සහල් සකස් කර ගැනීමට කාලයක් ගත වන බැවින් වී මෝල් 03 ක් ප්‍රමාණවත් නොවන බැවින් දින රහිත චෙක්පත් ලබාගෙන විශ්වාසය මත කටයුතු කරන ලෙස උපදෙස් දෙන ලදී. මේ නිසා හිස් චෙක්පත් ලබාගැනීම වගකිව යුතු රාජ්‍ය ආයතනයක් විසින් නොකළ යුතු වුවත් අදාළ රැස්වීමේදී දුන් උපදෙස් අනුව කටයුතු කළා මිස විෂමාචාර ක්‍රියාවක් ලෙස කටයුතු නොකළ බව දන්වන අතර, මෙය රාජ්‍ය මුදල් අවභාවිතයකට ගැනීමක් ලෙස නොසලකන ලෙස කාරුණිකව ඉල්ලමි.

(ආ) මේ වන විට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර බොහෝමයක් මෝල්කරුවන් මෙම මුදල් පියවා ඇත. දැනට මුදල් නොගෙවීම පැහැර හැර ඇති මෝල් හිමියන් සම්බන්ධයෙන් අදාළ ප්‍රදේශවල පොලීසි වෙත පැමිණිලි කර අවශ්‍ය නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු යොදා ඇත. අදාළ පර්යේෂණ මේ දිනවල පොලීසිය මගින් සිදු කරනු ලැබේ.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මේ ආකාරයට කටයුතු කිරීමට සිදුව ඇත්තේ කාර්ය මණ්ඩල හිඟතාවය මෙන්ම, එදින පැවති ප්‍රායෝගික තත්ත්වයන් හේතු කොට ගෙනය. කෙසේ වෙතත් මේ වන විට සියලුම නිකුත් කිරීම්වල නියමිත බලය බෙදා හැරීමක් තුළින් ඉටු කරනු ලබන අතර, නිකුත් කිරීමේ කුවිතාන්සි සමග සතිපතා සංසන්දනය කිරීමක්ද, තොග ගබඩාවෙන් නිකුත් කර අදාළ මෝල්කරු විසින්ම ලබා ගත්තාද යන්න තහවුරු කර ගන්නා ක්‍රමෝපායයන්ද සකස් කර ඒ අනුව කටයුතු ඉටු කරමින් පවතී.

## 3.9 මෙහෙයුම් සමාලෝචනය

(අ) දිවයිනේ වැඩි ප්‍රමාණයක් වී නිෂ්පාදනය කරනුයේ සම්බා වී නොවන අතර, රතු නාඩු වී වර්ග වේ. වී අලෙවි මණ්ඩලය සහතික මිලට වී මිලදී ගැනීමේදී වී වර්ග කර පරිභෝජනයට සුදුසු වී පමණක් මිලදී ගත නොහැකි අතර ප්‍රමිතියෙන් යුත් සෑම වී වර්ගයක්ම අනිවාර්යයෙන්ම මිලදී ගත යුතුව ඇත. මේ අනුව විශාල වශයෙන් කාලයක් හිඟව පැවති රතු වී වර්ග දැන් වැඩියෙන් වගා කරන අතර මෙම වීවලට දිවයිනේ මෙන්ම විදේශීයවද ඉල්ලුමක් නොමැති වුවත් වී අලෙවි මණ්ඩලය අනිවාර්යයෙන්ම මිලදී ගැනීමට සිදු වී ඇත.

(ආ) වී අලෙවි මණ්ඩලයේ කාර්යභාරය වනුයේ පවත්නා වී නිෂ්පාදනයෙන් 5% ක් 10% ක් මිලදී ගැනීම ම නොවන අතර, සුරක්ෂිත තොගයක් එනම් ආහාර හිඟයක් ඇති නොවන පරිදි වී තොගයක් රැස් කර තබා ගැනීමය. එම කරුණ ඉටු කර ඇති අතර අවම ප්‍රතිශතය මිලදී ගැනීමට සිදුනොවුනා යනු ගොවියාට සහතික මිලට වී විකිණීමට වෙළඳපළක් තිබීම හෝ අස්වැන්න අඩුවීම යන කරුණු බලපෑ හැකිය. එමඟින් වී අලෙවි මණ්ඩලයේ ඉලක්කවලට ළඟා වීමට අපොහොසත් වූවා යන්න ලෙස සැලකිය නොහැක.

තවද සමහර අවස්ථාවලදී අවශ්‍ය තරම් මූල්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් නොලැබෙන අවස්ථාවලදී වුවද වී මිලදී ගැනීම සීමා කිරීමට සිදුවනු ඇත.

## 3.10 අනාර්ථික ගනුදෙනු

(අ) අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කොට ස්ථාවර තැන්පත් ගිණුමක යෙදවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) පොදු ව්‍යාපාර කාරක සභා නිර්දේශ මත එලෙස කරනු ලැබූ අතර ලාභාංශ බෙදීම් මේ දක්වා කර නොතිබුණි.

## 3.11 හඳුනාගත් පාඩු

(අ) වී අලෙවි මණ්ඩලය මේ වන විට ගනුදෙනු කරනුයේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය මත රාජ්‍ය බැංකුවලින් ලබා ගන්නා ණය මඟිනි. වී විකුණන සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් මුදල් ලැබූ විට මෙම ණය මුදල් වරින් වර පියවීම් කර ඇත. එබැවින් මෙම අයිරා පොලී සහ බැංකු ණය පොලී ගෙවීමට සිදුව ඇත.

(ආ) විගණකවරුන් දක්වා ඇති කරුණු සමඟ එකඟ වෙමි. අමාත්‍ය මණ්ඩල සංදේශයකින්ද මෙම වී තොග භෞතික සත්‍යාපනයකට ලක් කිරීමට විගණක දෙපාර්තමේන්තුව වෙත පැවරුවද මේ දක්වා එම කාර්යය සිදුකර ගැනීම අපහසු වූ අතර, මෙම කාර්යය විගණන සමාගමකින් හෝ මෙම වර්ෂයේදී සිදු කර ගැනීමට නියමිතය.

## 3.12 පොදු ව්‍යාපාර කාරක සභා නියෝග ක්‍රියාත්මක නොකිරීම

(අ) අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර ගැනීමට අදාළ විධිවිධාන සලසා ඇත. රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණකට පැවරී ඇති කාර්යභාරය අනුව වී අලෙවි මණ්ඩලය විගණනයට ලක් වී නොමැති බවද දන්වමි.

(ආ) සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ ලේකම් විසින් අමාත්‍යාංශයේ කමිටුවක් පත් කර තිබූ අතර, විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුද එහි සාමාජිකයෙකුව සිටියේය. නිසි පරිදි එම කාර්යය සිදු නොවූ බැවින් විගණකවරුන් දක්වන කරුණ ඉටු කර ගත නොහැකි විය. එය පහසු කරනු සඳහා පොදු ව්‍යාපාර කාරක සභාවේ උපදෙස් පරිදි 2008 වර්ෂයට පෙර පැවති ශේෂ අවිනිශ්චිත ගිණුමක රඳවා තබා ගැනීමටත්, කමිටු තීරණ මත එය ලියා හැර නව ශේෂපත්‍රයක් සකස් කිරීමටත් අදාළ කටයුතු කරනු ලැබේ.

(ඇ) මේ සඳහා ඉහත පිළිතුරම වේ.

## 3.13 කාර්ය මණ්ඩල පරිපාලනය

වී අලෙවි මණ්ඩලයේ පරිපාලනමය කටයුතු විධිමත් කිරීමේ වැඩපිළිවෙළක් යටතේ මෙම සියලුම තොරතුරු විගණනයට ලබාදෙන ලෙස දන්වන ලදී.

(අ) ඉදිරියේදී මෙම තනතුර පිරවීමට කටයුතු කරනු ලැබේ.

(ආ) මේ වනවිට නව තනතුරු අනුමත කරවාගෙන ඇති අතර බඳවා ගැනීම් කටයුතු සඳහා පුවත්පත් දැන්වීම් පළකර විනිවිද භාවයකින් යුක්තව බඳවා ගැනීම් කටයුතු කරමින් පවතී.

(ඇ) විගණකවරුන් දක්වන කරුණු පිළිබඳ තරයේම පිළිගනිමි. මෙම බොහෝ කරුණු වලට හේතු සාධක වූයේ සුදුසුකම් හා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් නොමැතිවීම නිසාය. මේ වනවිට එම කාර්යයන් බොහෝමයක් ඉටු කරගනිමින් පවතී. සහකාර ප්‍රාදේශීය කළමනාකරුවන් ලෙස උපාධිධාරීන් ඉදිරියේදී බඳවා ගැනීමට නියමිතය.

(ඈ) මේ පිළිබඳ අදාළ කටයුතු දැනට කරගෙන යමින් පවතින අතර අධ්‍යාපන සුදුසුකම් තහවුරු කර ගැනීම සඳහා අදාළ ආයතන වලට යොමු කර ඇත. එම ආයතනවලින් සනාථයන් ලද විගසම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

### 3.14 අයවැය පාලනය

විගණකවරුන් විසින් දක්වා ඇති පරිදි 3.1.2 (ඇ) අනුව මෙයද නිසි කාර්ය මණ්ඩලයක් නොමැති වීම හේතු කොට ගෙන සිදුව ඇති කරුණකි.

## 04. පද්ධති හා පාලන

අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් 2008 වර්ෂයේදී නැවත ආරම්භ කරන ලද වී අලෙවි මණ්ඩලය නියමිත නිලධාරීන් හා භෞතික සම්පත් කිසිවක් නොමැතිව එවකට පැවති ශ්‍රී ලංකා කෘෂි නිෂ්පාදන අලෙවි අධිකාරියේ අදාළ සුදුසුකම් සපුරා නොලත් සමහර නිලධාරීන් අනුයුක්ත කිරීමට සිදු විය. ඉතා අපහසුවෙන් හා වී මිලදී ගැනීමේ කාර්යයත් සිදු කරමින්, අතහැර දමා තිබූ ගබඩා නිසියාකාරව ප්‍රතිසංස්කරණය කරගනිමින් මෙතෙක් කල් පවත්වාගෙන ඒම ඉතාම අපහසු කටයුත්තක් බව ඔබටද වැටහී යනු ඇත.

කෙසේ වුවත් විගණන නිරීක්ෂණයේදී පෙන්වා දී ඇති මෙම පද්ධති හා පාලන ක්‍රම බොහෝමයක් සඳහා මේ වනවිට විසඳුම් ලබාදී ඇත. සමස්ත ක්‍රියාවලියම පරිගණකගත කිරීමේ කාර්ය සඳහාද දැනට කටයුතු කරමින් පවතී. කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් අනුමත කරගෙන ඒ අනුව කටයුතු කරන ලදී. කෙසේ වුවද සුලු අඩුපාඩුකම් මධ්‍යයේ වුවද මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, ඉඩ පහසුකම් සහ සම්පත් උපයෝගී කරගෙන රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී මහින්ද චින්තන වැඩපිළිවෙළ අනුව වී අලෙවි මණ්ඩලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට හැකි වූ බව සතුටින් අවධාරණය කරමි. එයට එක් නිදසුනක් ලෙස 2009 වසරෙන් පසු සහල් වෙළඳපළ තුළ මැදිහත්කරුවකුගේ සේවය වඩාත් හොඳින් ඉටු කරමින් පාරිභෝගිකයාට සාධාරණ මිලකට සහල් ලබා දී ඇති බව දැක්විය හැකිය.

**කේ. බී. ජයසිංහ**
සභාපති
වී අලෙවි මණ්ඩලය

පිටපත් : ලේකම් - සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය
ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

